

# වලපනේ සිට අසිරිමත් නිවාඩුවක්

වලපනේ ප්‍රදේශයේ ඉපදී හැදී වැඩී ශිල්ප හදාරා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා අජන්ත සෙනෙවිරත්න මහතා විදේශගත වන්නේ 2002 වසරේදීය.

ඉන්පසු වසරකට වරක් හෝ දෙවරක් වලපනේට පැමිණ සිය දෙමාපියන් සහෝදරයින් නෑදෑ හිතවතුන් සහ යහළු මිත්‍රයින් මුණගැහෙන මෙතුමා ඔහු සමඟ එන යන දේශීය හා විදේශීය මිතුරන් වෙනුවෙන් සංචාරක හෝටලයක් මේ ප්‍රදේශයේ යම් දිනක ඉදිකළ යුතු යැයි අරමුණු කරගෙන සිටි බවත් මේ සඳහා ඔහුට තම පවුලෙන්ද අසිරිමත් දිරි දීමක් ලැබුණු බවත් පවසයි.

ඔස්ලින්ක් හෝටලයේ ඉදිරිකිරීම් කටයුතු ඉතාම සරලව 2010 වසරේදී ආරම්භ කෙරුණ අතර කාලයත් සමඟ එය ඉතාම සංකීර්ණ හා දැවන්ත කර්තව්‍යක් වූ බව පැවසේ. එහි අවසන් ප්‍රතිඵලය වූ මේ සංචාරක හෝටලය වලපනේ නගරයට ගෙන එන්නේ අපූරු සුන්දරත්වයකි.

පිහිටීම අතිනුත්, ගෘහ නිර්මාණ තාක්ෂණය අතිනුත්, ප්‍රමිතිය අතිනුත්, ඉඩකඩ අතිනුත්, පහසුකම් අතිනුත් මේ ආයතනය වෙනත් කිසිම ආයතනයකට සම කළ නොහැකි සුවිශේෂී එකක් ලෙස නිමවී ඇති බව පෙනේ. මෙහි ආයතනාධිපති විශේෂඥ වෛද්‍ය අජන්ත සෙනෙවිරත්න මහතා දැනට ඕස්ට්‍රේලියාවේ පදිංචි අතර ආයතනයේ සියළුම කටයුතු එතුමාගේ නිරන්තර අධීක්ෂණයට ලක්වන අතර උසස්ම තත්වයේ පාරිභෝගික සේවාවක් ලබා දීමට අවශ්‍ය සියළුම පියවර නිරන්තරයෙන්ම ගැනෙන බව දැන ගැනීමට තිබේ.

වලපනේ ප්‍රදේශයේ පිහිටීමත්, ජෛව විවිධත්වයත් එහි ඇති සුන්දරතම ස්ථානත් මේ පුංචි දිවයිනේ අන් කවර තැනක හෝ ලෝකයේ වෙනත් තැනක දැක නැති බව තේරුම් ගත් මේ තරුණ වෛද්‍යවරයා මෙවන් තැන් සොයා යන 21 වන ශතවර්ෂයේ සංචාරකයින් උදෙසා මේ ස්ථානයේ මේ හෝටලය ඉදිකිරීමට තරම් දක්ෂ වී ඇත.

ඔස්ලින්ක් (මිකසබන) කියන නම ඕස්ට්‍රේලියාවට මෙම ආයතනයේ ඇති සම්බන්ධය කියාපාන අතර ආයතනයේ ලාංඡනයේ මුලින් ඇති කෙලවරක් නැති ගැටය මේ සම්බන්ධය නියෝජනය කරන බව පැවසේ. සමහර දකුණු ආසියාතික රටවල මේ ගැටය සුභ ලකුණක් ලෙස පෙන්වන අතර බෞද්ධයෝ එය අනන්තවූ බුදු ගුණ නියෝජනය කරන බව පවසයි. එවන් ලාංඡනයක් සහ දැක්මක් පෙරටු කරගත් මෙම ආයතනයේ ආදරය, කරුණාව, මෛත්‍රීය, හිතවත්කම, අවංකකම ආදී සුබවාදී බෞද්ධ දැක්මන් නිරන්තරයෙන්ම දර්ශනය විය යුතු බවත් ඒවා තවත් වර්ධනය වී ප්‍රගුණ වී පැවතිය යුතු බවත් ආයතනාධිපති තුමාගේ පරම පැතුම සහ විශ්වාසය වී තිබේ.

පෙරදිග සයුරේ මුතු ඇටයක් සේ සැලකෙන මේ මනරම් දූපත ඕනෑම සංචාරකයෙකුගේ සිත් ඇදගැනීමට සමත් බව තව දුරටත් තහවුරු කරන්නේ ලෝකයේ නොයෙකුත් රටවල සැරිසරා රැස් කරගත් දැනුම අත්දැකීම ඇති මේ ප්‍රවීන වෛද්‍යවරයායි. ඔහු පවසන ආකාරයට මධ්‍යම කඳුකරයට පැමිණෙන සංචාරකයන්ට එහි සිට ඕනෑම දිශාවකට ගමන් කරමින් මනස්කාන්ත සහ අතිශය සුන්දර ස්වභාව සෞන්දර්ය දැකබලා ගැනීමටත්, ගවේශණය කිරීමටත් හැකි බවයි.

වලපනේ නගරය මුහුදු මට්ටමේ සිට අඩි 3000කට ඉහළින් පහිටා ඇති අතර එය වටකර ඇත්තේ මනස්කාන්ත කඳුවැටි පෙළකිනි. ඔස්ලින්ක් හෝටලය නගර මධ්‍යයේ ඉදිකර ඇති අතර එහි වහලය මත 360ද ක වට රවුමක් පරාසය වන පරිදි නැරඹුම් මැදිරියක් ඉදිකර ඇත්තේ සංචාරකයන්ට මේ ප්‍රදේශයේ ඇති සුන්දරත්වය රිසි සේ දැකබලා ගැනීමට අවශ්‍ය සුවිශේෂී අවස්ථා උදාකර දෙමිනුයි.

සදාහරිත සානුවක් වූ මේ උස් බිමට වසර පුරා ලැබෙන වර්ෂාපතනයෙන් පෝෂණය කෙරෙන ගංගා, ඇළදොළ සහ දියඇලි රන්දෙනිගල ජලාශයට එක් කරන්නේ එහි ජීවයයි. මෙහි ඇති නැරඹුම් මැදිරියට මේ ජලාශයද ඈතින් දිස් වේ.

වලපනේ ප්‍රදේශයේ බොහෝ ආකර්ශනීය ස්ථාන පිහිටා ඇති අතර සංචාරකයින්ගේ සිත් බෙහෙවින් ඇදගත් ස්ථාන කිහපයක් ගැන සඳහන් කිරීමට කැමැත්තෙමු.

කුරුඳුඔය දිය ඇල්ල වලපනේ නගරයට ඉතාම ආසන්නයේ පිහිටි උස මීටර් 189 වන ලංකාවේ දෙවෙනියට උස දිය ඇල්ලයි. වලපනේ නගරයට සැපයෙන්නේ මෙයින් ලැබෙන පිරිසිදු ජලයයි. එසේම මේ ජලය උපයෝගී කරගෙන විදුලිබලය නිපදවන බලාගාරයක්ද 2016 වසරේදී විවෘත කෙරිනි.

ඔස්ලින්ක් හෝටලයේ සිට මේ දිය ඇල්ලට ලඟාවිය හැකි මාර්ග කිහිපයක් ඇති අතර ඒ හැම එකක්ම සුන්දරය. මේ අතරින් වලපනේ නගරයට ඉහලින් පෙනෙන උසම කඳුවැටිය නැග එතැන් සිට පහලට ගමන් කරන මාර්ගය වඩාත් සුන්දර බව සංචාරකයින් පවසයි. කඳුවැටියට නැගීමට තේ වතු මැදින් වැටී ඇති මාර්ගයේ සාමාන්‍ය වාහනයකින් ගමන් කළ හැකි අතර "දෙමර අයැක ාරසඩැ" වාහනයකින් කෙලින්ම ඉහලට නැගීමටද පුළුවන. පා ගමනින් මේ තැනට නැගීමට දක්ෂ කඳු නගින්නෝ සමත් වෙති.

කෙසේ හෝ මෙතනය ලඟාවන ඔබට තිළිණ වන්නේ මනස්කාන්ත දර්ශන පෙලකි. ශ්‍රී ලංකාවේ වෙන කිසිම තැනක දැක නැති මේ අපූරු ස්වභාව සෞන්දර්යය රස විඳ කැමරා කාචයේ සටහන් කරගෙන තවත් කිලෝමීටරයක් පමණ දුරක් පහළට බැස යන ඔබට කුරුඳුඔය දියඇල්ල දිස් වේ.එහි මුලට ගොස් රිසි සේ ආශ්චර්යය විඳින්නටත් එම වටාපිටාවේ සුන්දරත්වය දැකබලා ගැනීමටත් ඔබට හැකිය. වසර මුලුල්ලේම කඩා හැලෙන සුදෝ සුදු මේ දිය දහර ඔබේ සිත වසඟ කර ගනු නියතයි.

වලපනේ ප්‍රදේශයේ පිහිටා ඇති තවත් ඉතාමත්ම සුන්දර ස්ථානයක් තමයි ගොලුමලේ. දේශීය හා විදේශීය සංචාරකයින්ගේ අතිශය ඇගයීමට ලක්ව ඇති මේ ස්ථානයට ලඟාවීමට ඔස්ලින්ක් හෝටලයේ සිට ගතවන්නේ පැය භාගයක පමණ කාලයකි. එහෙත් මේ ප්‍රදේශයට ඇතුළුවන ඔබට දැනෙන්නේ ඔබව සදාහරිත වනාන්තරයක් මැද්දට ගමන් කරන බවයි.

ඇත්තටම "ගොලුමලේ " කියන නම හැදිලා තියෙන්නේ ගඟ එහි මැද ඇති ගං ලිඳකට නොපෙනී ගිහින් අනික් පැත්තේ ඇති කවුළුවකින් එළියට එන නිසයි.

එම ක්‍රියාවලිය හොඳින් දැක ගන්න නම් ගඟේ වතුර මට්ටම අඩු විය යුතුය. අනික් වෙලාවට මේ සියල්ල වතුරෙන් යටවන නිසා නොපෙනී යනවා. මේ ගඟ පතුලේ ගල් ලිං විශාල ප්‍රමාණයක් ඇති අතර මේ ලක්ෂණය පමණක් වුවද මේ ප්‍රදේශයට පමණක් ආවේනික වූ විශේෂත්වයකි.

රිසි සේ මිරිදිය ජලයෙන් නාගෙන, අප හෝ ගැමියන් පිලියෙන කර දෙන ආහාර පාන රස විඳ, ගල් තලාවේ සැතපෙන ඔබට රාත්‍රී කාලය ලඟාවන විට අට්ටාලයට නැගීමට අණ ලැබෙන්නේ මේ ප්‍රදේශයට රන්දෙනිගල වන රක්ෂිතයේ නිදහසේ සැර සරන අලි ලඟාවන නිසයි.

මේ ගඟේ එක පැත්තක අලි නිදහසේ ජීවත්වන අතර අනෙක් පැත්තේ අපේ ගැමියන් කුඹුරු කොටාගෙන අනෙකුත් අල බතල සහ එළවළු වගා කරගෙන සතුටින් ජීවත් වෙයි. අපේ රටේ මෙවන් සාර්ථක සහජීවනයක් දක්නට ලැබෙන්නේද ඉතා කලාතුරකිනුයි. මෙයට ගඟ දිගේ ඉදිකර ඇති විදුලි වැටෙන් ලැබෙන පිටුවහල කියා නිමකල නොහැක. ගඟට සමාන්තරව තවත් පහළට යද්දී ගඟ හරහා යාමට ඉදිකල අත්වැල් පාලමට ලගා විය හැකියි. එතනින් කන්ද කැටියට (බදුල්ල දිස්ත්‍රික්කය) ඉතාමත් කිට්ටුයි. මේ පහල ප්‍රදේශය බොලගන්ධාවෙල නමින් හැඳින්වෙන අතර මෙහි ඇත්තේද අරුම පුදුම සුන්දරත්වයකි.

වලපනේ නගරයට සහ සංචාරක හෝටලයට ඉතාමත් ආසන්නයේ පිහිටා ඇති තවත් ආකර්ෂණීය ස්ථානයක් තමයි ජපන් සාම චෛත්‍යය. කන්දක් උඩ ඉදි කර ඇති මේ ගල් පඩි 400 ක් පමණ නැගිය යුතුයි.මේ දුරම ත්‍රිරෝද රථයකින් හෝ වෙනත් වාහනයකින් විනාඩි 10කට අඩු කාලයකින් ගමන් කර එහි ලඟා වීමටත් හැකිය.

ලංකාවේ ජපන් චෛත්‍ය හයක 1984 වසරේදී ඉදි කෙරුණු අතර මේ ස්ථානයේ පිහිටීම සහ සුන්දරත්වය මෙයට හිමිකම් කීමට සුදුසුකමක් වී ඇති බව පෙනේ. ඉහලින් දිස්වන රන්දෙනිගල ජලාශය සහ තේ වතු ආදියත් මේ ස්ථානයේ ඇති නිස්කලංක පරිසරයක් සංචාරක ඔබේ සිත් පිනවනු ඇතැයි අපි සිතමු.

ජපන් ජාතික ස්වාමීන් වහන්සේ මෙහි වාසය කරන දිනවලට උදේ පාන්දරින් රබාන වයන්නා සේ වටාපතක් වැනි යමකට තාලයට ගසමින් ගාථා කියමින් වලපනේ නගරයට පිඬු සිඟා වඩියි. මෙය දන්නා නගරවාසීන් හීල දානය සූදානම් කර පිලිගන්වන්නේ සැදැහැ සිතිනුයි.

පුංචි ලෝකාන්තය කියන ස්ථානය පිහිටා ඇත්තේ වලපනේ නගරයට කිලෝමීටර කිහිපයක් ඈතිනුයි. මෙම ස්ථානය හෝටන් තැන්නේ පිහිටි ලෝකාන්තයේ කුඩා ආකෘතියක් ලෙස දිස්වන අතර මේ ස්ථානයට ලඟ වීමට විශේෂ ආයාසයක් දැරීමට අවශ්‍ය නැත. ත්‍රිරෝද රථයකින් හෝ ඔබ ගමන් කරන වාහනයෙන් ද ලගා විය හැකි මේ ස්ථානය හෝටන් තැන්නට යා නොහැකි අයටත් ලෝකාන්තය දැකීමට ලැබෙන කදිම අවස්ථාවකි. මේ ස්ථානයේ සිට ඈත බලන ඔබේ දසුන මීදුමෙන් වැසී යාමට ඇති ඉඩකඩද සාපේක්ෂව අඩුය. මෙතැන් සිට පහල බලනඔබට සරුසාර මිටියාවතක් ඈතින් දිස්වේ. ඉතා සමීපයට යාම බියකරුය. එසේම, අනාරක්ෂිත නිසා ප්‍රවේශම් විය යුතුය.

ඈත ක්ෂතිජයේ දිස්වන කොලපාටින් වැසුනු කඳුවැටි ඔබ මවිත කරනු ඇති. ඔබට අවශ්‍ය නම් ඒ ප්‍රදේශවලට ඔබව රැගෙන යාමට පහසුකම් සලසා දිය හැකියි. (ඔබ කළ යුතුතේ ඉල්ලා සිටීම පමණයි.)

මේ ලිපිය කියවන ඔබ තේ කෝප්ප කීයක් බී ඇත්දැයි මම නොදනිමි. එහෙත් ඔබ කවදා හෝ කර්මාන්ත ශාලාවක ඇතුලේ තේ කොල නිශ්පාදනය කෙසේ සිදුවේ දැයි දැක බලාගෙන ඇත්දැයි ඇසීමට මට සිතේ. එසේ නැත්නම් "ලවර්ස් ලීප් " තේ කර්මාන්ත ශාලාව ඒ වැඩේට කියාපු තැනය. තේ දලු නෙලීමේ සිට තේ කොළ වර්ග කිරීම සහ පැකට් කිරීම දක්වා වූ සියලුම පියවරවල් විස්තරාත්මකව දැන ගැනීමට මේ ස්ථානයේ කාර්යය මණ්ඩලය විසින් සියලු පහසුකම් සපයා ඇති බව ඔබට දන්වනු කැමැත්තෙමි. මේ ස්ථානයට ඔස්ලින්ක් හෝටලයට කිලෝ

38 වන පිටට